# සැලකිය යුතුයි
# EASYPAY තැන්පතු

හිතාමතා විකෘති කිරීම්, වෙනස් කිරීම් සහ හානි කිරීම් සිදුකරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු කිසිවක් **2018 අප්‍රේල් මස 01 වැනි දින සිට පිළිනොගන්නා ලෙසට, ශ්‍රී ලංකා මහා බැංකුවේ මගපෙන්වුම්වලට අනුව සියලු බැංකු වෙත උපදෙස් දී ඇත. 2018 අප්‍රේල් 01 දින සිට ශ්‍රී ලංකා මහා බැංකුව විසින් මහජනතාව වෙනුවෙන් එවැනි නෝට්ටු මාරු කිරීම සිදුකරනු ඇත.**

අප විසින් මෙකී අවශ්‍යතාවට අනුකූලව කටයුතු කිරීම පිණිසණී 2018 මැයි 01 දිනෙන් පසු තැන්පත් කරනු ලබන එවැනි නෝට්ටුවල වටිනාකම සමස්ත තැන්පතු වටිනාකමින් අඩු කරනු ඇති බවත්, එකී නෝට්ටු තැන්පතුව සිදුකළ ශාඛාවෙහි රඳවා තබාගනු ඇති බවත් කරුණාවෙන් සලකන්න.

ශාඛාවක් නොවන ස්ථානයක තැන්පතු යන්ත්‍රයක දී සිදුකළ ගෙවීම්වලදී, එවැනි නෝට්ටු, යුනියන් පෙදෙස පිහිටි අප ශාඛාවෙන් නැවත ලබාගත හැකිය.

*** උපචිත වන යම් ගාස්තු/අයකිරීම් සම්බන්ධයෙන් බැංකුව විසින් නිකුත් කරන ලද ගාස්තු ලේඛනය මගින් HSBC ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් බැඳී සිටිනු ඇති අතර, මෙම හේතුව නිසා දරන්නාට සිදුවන කිසියම් පාඩුවක්/හානියක් පිළිබඳව බැංකුව විසින් කිසිදු වගකීමක් දරනු නොලැබේ**

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනතාව වෙත කෙරෙන දැනුම් දීමයි !**



**සිතා මතා විකෘති කර ඇති ව්‍යවහාර මුදල් නෝට්ටු 2018 මාර්තු 31 වැනි දිනට පසු නැවත දැනුම්දෙනතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාලයක් හරහා හෝ ලියාපදිංචි තැපෑලෙන් ප්‍රධාන කාර්යාලය වෙත එවීම මගින් පිරිසිදු මුදල් නෝට්ටුවලට හුවමාරු කරගත හැකිය.**

මෙම සේවාව සඳහා අවශ්‍ය වන පෝරමය ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙන් (www.cbsl.gov.lk) හෝ ප්‍රාදේශීය කාර්යාලයක් වෙතින් හෝ ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකු ශාඛාවක් වෙතින් ලබා ගත හැකිය.



**කෙසේ වෙතත්, අත් වැරදීමකින් කුඩා ඉරක් හෝ තිතක් වැනි සලකුණක් සටහන් වී ඇති මුදල් නෝට්ටු සිතා මතා විකෘති කර ඇති නෝට්ටු ලෙස නොසැලකෙන අතර එවැනි මුදල් නෝට්ටු ගනුදෙනු සඳහා තව දුරටත් භාවිතා කළ හැකිය.**

**මුදල් නෝට්ටු විකෘති නොකර පිරිසිදුව පරිහරණය කරමු!**
**ජාතික ධනය සුරකිමු!**

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, 30, ජනාධිපති මාවත, කොළඹ 1
දුරකථනය: +94 112477253 ෆැක්ස්: +94 112477726 ඊ මේල්: currency@cbsl.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA